**තල් සංවර්ධන මණ්ඩලය - 2023**

**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තල් සංවර්ධන මණ්ඩලයේ ("මණ්ඩලය") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරන ප්‍රමිතීන්ට අනුකූල නොවීම**

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 02 හි 27(ආ) ඡේදයට අනුව, කාලච්ඡේදය තුළ ලැබිය යුතු මුදල්හි අඩුවීමක් මඟින්, චක්‍ර ක්‍රමය යටතේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහය වැඩි විය යුතුය. නමුත් සමාලෝචිත වර්ෂය තුළදී රුපියල් 3,871,611 ක් වූ වෙළඳ ලැබිය යුතු මුදල්හි අඩුවීම මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් අඩු කර දක්වා තිබුණි. | කළමනාකාරීත්වය විසින් නිවැරදි කර අනාගතයේදී එවැනි වැරදි සිදු නොවීමට පියවර ගනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව ක්‍රියා කළ යුතුය. |
| (ii) | පෙර වසරේ මූල්‍ය ප්‍රකාශනවල වීරවල ගොඩනැගිල්ල සඳහා නොනිමි වැඩ රුපියල් 1,504,555 ක් වැඩියෙන් දක්වා තිබීම, ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 03 ට අනුකූලව, අතීතානුයෝගීව ගැළපීමකින් තොරව සමාලෝචිත වර්ෂයේ හිමිකම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශය තුළ නිවැරදිකර තිබුණි. තවද, එය මුදල් නොවන නිවැරදි කිරීමක් වූ බැවින්, මෙම ගැළපීමත් සමඟ සැබෑලෙසම මුදල් ගලායාමක් සිදු නොවූවද, නිවැරදි කරන ලද එම රුපියල් 1,504,555 ක මුදල සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වැරදි ලෙස අඩු කර දක්වා තිබුණි. | අනාගතයේදී එවැනි වැරදි සිදු නොවීමට කළමනාකාරීත්වය සහතික වනු ඇත. | - එම - |
| (iii) | ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 07 හි 50 වැනි ඡේදයට අනුකූලව ආයතනයේ මෙහෙයුම් කටයුතු වලදී සමාන ස්වභාවයක් හෝ ක්‍රියාකාරීත්වයක් ගන්නා වත්කම් කාණ්ඩගත කිරීමකින් තොරව නිෂ්පාදන උපාංගවල පිරිවැය රුපියල් 119,098,441 ක් දේපල, පිරියත හා උපකරණ යටතේ දක්වා තිබුණි. | ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර ට අනුකූලව 2024 මූල්‍ය ප්‍රකාශනවල අදාළ කාණ්ඩය යටතේ නිෂ්පාදන උපාංග කාණ්ඩය නිවැරදි කරනු ලැබේ. | - එම - |
| (iv) | ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 07 හි 71 වන ඡේදයට අනුව, වත්කමක ප්‍රයෝජනවත් ජීව කාලය නිර්වචනය කරනු ලබනුයේ ආයතනයට වත්කමෙන් අපේක්ෂිත උපයෝජ්‍යතාවය මත පදනම්වය. කෙසේ වෙතත්, ආයතන විසින් සාමාන්‍යයෙන් වසර 15 සිට 25 දක්වා ප්‍රයෝජනවත් ජීව කාලයක් ඇස්තමේන්තු කර තිබියදී, මණ්ඩලය විසින් ගොඩනැගිල්ල වසර 20ක් වෙනුවට වසර 10 ක් පුරාවට ක්ෂය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, | ගොඩනැගිල්ල නැවත තක්සේරු කර ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර ප්‍රකාරව වසර 15 සිට 25 දක්වා කාලය තුළ ක්ෂය කිරීමට කළමනාකාරීත්වය විසින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ඇත. | - එම - |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය සඳහා වූ අතිරික්තය රුපියල් 3,316,874 කින් අවතක්සේරු වී තිබූ අතර, වසර අවසානය වන විට රුපියල් 74,913,538 ක සමුච්චිත ක්ෂයවීම් මුල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (v) | සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රුපියල් 23,000,000 ක ප්‍රාග්ධන ප්‍රදානයක් සහ විශේෂ ව්‍යාපෘතියක් සඳහා ලද රුපියල් 6,086,000 ක රජයේ ප්‍රදානයක් ශ්‍රී.ලං.රා.ගි.ප්‍ර 11 ට අනුකූලව ආදායමක් ලෙස හඳුනාගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා අතිරික්තය රුපියල් 29,086,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | අනාගතයේදී එවැනි වැරදි සිදු නොවන බවට කළමනාකාරිත්වය සහතික වනු ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | මණ්ඩලයට අයත් සහ 2017 නොවැම්බර් 24 දින රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති ඉඩමක් තක්සේරු කර මුල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, ජංගම නොවන වත්කම්වල වටිනාකම මුල්‍ය ප්‍රකාශනතුළ අඩුවෙන් දක්වා තිබුණි. තවද දීර්ඝ කාලීනව භාවිත වන ඉඩම් 8ක අයිතිය පැවරීමට මණ්ඩලය කටයුතු කර නොතිබුණි. | කරෙයිනගර් හි ඉඩම සහ නිෂ්පාදන ගොඩනැගිල්ල ඇස්තමේන්තු කර 2024 මුල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කරන ලෙස කළමනාකාරිත්වය දැනටමත් අදාළ අංශයට උපදෙස් දී ඇත. | මණ්ඩලයට අයත් සියලුම වත්කම් තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |
| (ii) | වසර පහක අවම සේවා කාලයක් සම්පූර්ණ කර ඇති කාර්ය මණ්ඩල සාමාජිකයින් සඳහා පාරිතෝෂික වෙන්කිරීම් සිදුකර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය සඳහා ලාභය රුපියල් 641,670 කින් වැඩියෙන් දක්වා තිබුණි. තවද වසර පහක සේවා කාලයක් සම්පූර්ණ කළ කාර්ය මණ්ඩලය සඳහා පාරිතෝෂිත දීමනාව වසරක් සඳහා පමණක් ලබා දී තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, පාරිතෝෂිත දීමනා සඳහා වන ප්‍රතිපාදන මුල්‍ය ප්‍රකාශනවල රුපියල් 2,285,770 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඔබගේ මාර්ගෝපදේශයට අනුව වසර 5 සම්පූර්ණ කළ අය සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට අපි එකඟ වෙමු. | ප්‍රතිපාදන නිවැරදි ක්‍රමයට සකස් කළ යුතුය. |
| (iii) | ගෙවා ඇති පාරිතෝෂිත මුදල රුපියල් 2,077,111 වෙනුවට මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය යටතේ රුපියල් 6,607,428ක් ලෙස වැරදි ලෙස සටහන්කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය රුපියල් 4,530,317 කින් අඩුවෙන් දක්වා තිබුණි. | රුපියල් 6,607,428 ක පාරිතෝෂික ගෙවීම වැරදි ලෙස දක්වා ඇත. නියමිත මුදල වන රුපියල් 4,530,317 ක මුදල ජංගම වගකීම් යටතේ ලැයිස්තුගත කර ඇති අතර එය 2024 දී නිවැරදි කරනු ලැබේ. | මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවැරදිව සකස් කිරීමට ක්‍රියා කළ යුතුය. |
| (iv) | සමාලෝචිත වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලට (EPF) සේවක දායක මුදල් රුපියල් | 12% සේවා යෝජකයාගේ දායකත්වය EPF යටතේ | සේවක අර්ථසාධක අරමුදලට ලැබෙන |

| | | |
|---|---|---|
| 8,146,837 ක් වූ අතර, එය EPF වියදම් ගිණුම යටතේ වැරදි ලෙස වර්ගීකරණය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වැටුප් වියදම අවතක්සේරු වී ඇති අතර සේවක අර්ථසාධක අරමුදල් වියදම ද එම ප්‍රමාණයෙන් අධිතක්සේරු වී තිබුණි. | සටහන් ක අතරර ඇති අතර ඉතිරි කොටස වැටුප් යටතේ නිවැරදිව සටහන් කරනු ලැබේ. | සේවක දායක මුදල් වැටුප් වියදම් ගිණුම යටතේ වර්ග කළ යුතුය. |

**1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂනය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රුපියල් 20,712,184 ක ශේෂයේ පැවැත්ම සහ නිරවද්‍යතාවය තහවුරු කිරීම සඳහා ලිඛිත සාක්ෂි විගණනය වෙත ඉදිරිපත්කර නොතිබුණි. | මෙම කරුණ අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ රේඛීය අමාත්‍යාංශයේ අවධානයට යොමු කර ඔවුන්ගේ යෝජනා මත අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගනු ලැබේ. | විගණනය සඳහා අවශ්‍ය සියලුම සාක්ෂි ඔවුන් ඉල්ලා සිටිනවිට විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂනය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට වසර 06කට වැඩි කාලයක් හිඟව පවතින වෙළෙඳ ලැබිය යුතු මුදල් යටතේ ඇතුළත් කර ඇති එකතු වටිනාකම රුපියල් 4,338,434 ක විවිධ ණයගැති ශේෂ 08 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම කරුණ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඔවුන්ගේ යෝජනා මත අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | නියමිත වේලාවට අයවිය යුතු මුදල් අයකර ගැනීමට අවශ්‍ය පිළියම් යෙදිය යුතුය. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂනය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනට වසර 2ත් 5ත් අතර කාලයක් හිඟව පවතින රුපියල් 306,875ක් වූ වෙළෙඳ ණයහිමි ශේෂ 05ක් සහ රුපියල් 2,967,592ක් වූ විවිධ ණයහිමි ශේෂයන් 08ක් පියවීමට කටයුතු කර නොතිබුණි. | මූල්‍ය ප්‍රතිපාදන නොමැතිකම හේතුවෙන් ඉතිරි පියවීම් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව කොටස් වශයෙන් නුදුරු අනාගතයේදී සිදුකිරීමට නියමිතය. | ණයහිමි ශේෂයන් නියමිත වේලාවට පියවීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය --------------------------- | | | |
| | (i) මු.රෙ 177(1) | එකතු කරනලද මුදල් හැකි ඉක්මනින් බැංකුගත කළ යුතු වුවත් නියමිත දිනට වඩා තැන්පතු ප්‍රමාද කිරීමේ පුරුද්දක් කොළඹ කට්පහම් අලෙවි මධ්‍යස්ථානය විසින් අනුගමනයකර තිබුණි. මාස 02ක් පුරා සිදු කරන ලද විගණන පරීක්ෂණයන්හිදී නිරීක්ෂණය වූයේ, අවස්ථා 49කදී එකතු වටිනාකම රුපියල් 1,539,930ක මුදලක් තැන්පත් කිරීමට පෙර දින 3 සිට දින 8 දක්වා කාලසීමාවන් සඳහා රඳවා තබාගෙන ඇති බවයි. | ඉදිරියේදී කට්පහම් අලෙවි මධ්‍යස්ථානවල විකුණුම් තැන්පතු පිළිබඳව කළමනාකාරීත්වය දැඩිව නිරීක්ෂණය කරන අතර එවැනි වැරදි නැවත සිදු නොවීමට වගබලා ගනු ඇත. | මූල්‍ය රෙගුලාසිවල ට අනුකූලව කටයුතුකළ යුතුය. |
| | (ii) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 03/2015 මගින් සංශෝධිත මු.රෙ 371(2)(ආ) | රෙගුලාසිවලට පටහැනිව අවස්ථා 76 කදී මාණ්ඩලික නොවන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා එකතු වටිනාකම රුපියල් 1,601,850 ක තත්කාලීය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. තවද, මහා භාණ්ඩාගාරයෙන් පූර්ව අධිකාරියක් ලබා ගැනීමකින් තොරව, අවස්ථා 5කදී නියම කළ රුපියල් 100,000 සීමාව ඉක්මවමින් කළමනාකාරීත්වය විසින් කතු වටිනාකම රුපියල් 2,800,000ක එකතු කරන තත්කාලීය අතුරු අග්‍රිම ලබා දී තිබුණි. | අත්‍යවශ්‍ය අරමුණු සඳහා අතුරු අග්‍රිම භාවිතය පිළිබඳ ඉහළ අධීක්ෂණයක් කළමනාකරණය දිගටම පවත්වාගෙන යනු ඇත. ඉදිරියේදී මාණ්ඩලික නොවන ශ්‍රේණි සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමට අපි සහතික වෙමු. | මූල්‍ය රෙගුලාසිවලට අනුකූලව කටයුතුකළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2006 හි 4.2.1 ඡේදය. | සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | කළමනාකාරීත්වය විසින් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ පිළිපැදීම සහ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටි අනුගමනය කිරීම සඳහා නිසි ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ඉදිරියේදී ගනු ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් 11,954,969 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව පෙර වර්ෂයේ ඌනතාවය රුපියල් 24,786,100 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රුපියල් 12,831,131 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට හේතුව වනුයේ දේශීය විකුණුම් ආදායමෙහි ඉහළ යාමයි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමණාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂනය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 අගෝස්තු මාසයේ සිට අක්‍රියව පවතින තුලනය කිරීමේ ක්‍රමය, තොග කළමනාකාරිත්වය සම්පූර්ණයෙන්ම බිඳවැටීමට හේතු වී ඇති බව මහනුවර අලෙවි මධ්‍යස්ථානයේ පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. තවද, ප්‍රධාන කාර්යාලයේ අලෙවි ද්‍රව්‍ය පරිගණක පද්ධතිය තුළ යාවත්කාලීන කර නොතිබූ අතර, ආරක්ෂාව සඳහා CCTV නොමැතිකම ඇතුළුව අභ්‍යන්තර පාලනයන් ද නොතිබුණි. ඉල්ලුම් නොකළ භාණ්ඩ තොග කල් ඉකුත් වී තිබූ අතර කාර්ය මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකු ප්‍රමාණවත් ලෙස නිරීක්ෂණය කර නොතිබුණි. ශීතකරණ නොමැතිකම නරක්වන සුළු භාණ්ඩ කල් ඉකුත් වීමට හේතු වී තිබුණි. මීට අමතරව, එකතුව ඒකක 5,533 ක් වන හඳුනා නොගත් තොග අයිතම 15 ක් සහ රුපියල් 1,264,561 ක සෘණ අගයක් පෙන්නුම් කරන තොග අයිතම 21 ක් ඇති බවට නිරීක්ෂණය විය. | එය වහාම TALLY ක්‍රමයේ නිවැරදි කර ඇති අතර, ආරක්ෂාව සඳහා CCTV අලුත්වැඩියා කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. තවද, හඳුනා නොගත් වාර්තා විමර්ශනය කර වැරදි නිවැරදි කිරීමට කළමනාකාරිත්වය වහා පියවර ගනු ඇත. | ප්‍රධාන කාර්යාලයේ විකුණුම් අයිතම පරිගණක පද්ධතියේ යාවත්කාලීන කිරීමටත් ඉන්වෙන්ටරි නඩත්තුව සම්බන්ධයෙන් නිසි අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂනය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 ට පෙර මිලදී ගත් රුපියල් 805,000 ක් වටිනා පැස්වරයිසර් උපකරණයක් සහ ඔටෝ ක්ලේව් උපකරණයක් වසර පහක් පුරා නිෂ්ක්‍රීයව පවතින බව නිරීක්ෂණය විය. | පැස්වරයිසර් උපකරණය සහ ඔටෝක්ලේව් දැනටමත් නිවැරදි කර ඇති අතර ඒවා නිෂ්පාදන ක්‍රියාවලියට යොදාගැනීමට කළමනාකාරිත්වය අවශ්‍ය පියවර ගෙන ඇත. | වත්කම් ඵලදායී ලෙස භාවිතා කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3 වාහන සමූහය කළමණාකරණය**

| විගණන නිරීක්ෂනය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා මණ්ඩලය විසින් භාවිතා කරන ලද වාහන 22 ක ලොග් පොත් විගණනය සඳහා ඉදිරිපත් කර නොමැත. | අනාගතයේදී එවැනි වැරදි නැවත සිදු නොවන බවට කළමනාකාරිත්වය ඔබට සහතික වනු ඇත. | වාහන ලොග් පොත් විගණනය සඳහා ඉදිරිපත් කළ යුතුය. |

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂනය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාවේ කෙටුම්පත මුදල් වර්ෂය අවසන් වී දින 60ක් ඇතුළත විගණකාධිපති වෙත ලබා දිය යුතුය. කෙසේ වෙතත්, 2023 වර්ෂය සඳහා වූ මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන දින 182ක ප්‍රමාදයක් සහිතව 2024 අගෝස්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර වාර්ෂික වාර්තාව කෙටුම්පත් 2024 ඔක්තෝබර් 28 දින දක්වා ඉදිරිපත් කර නොතිබුණි. තවද, 2021 සහ 2022 වසර සඳහා මණ්ඩලයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි. | පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ නව මූල්‍ය කළමනාකරු පත් කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශය ඉදිරිපත් කිරීම ප්‍රමාද විය. අනාගතයේදී නියමිත වේලාවට ඉදිරිපත් කරනු ලැබේ. 2021 සහ 2022 වර්ෂ සඳහා වාර්ෂික වාර්තාව අමාත්‍යාංශ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. | මූල්‍ය ප්‍රකාශන සහ වාර්ෂික වාර්තාව කෙටුම්පත් නියමිත වේලාවට ඉදිරිපත් කළ යුතුය. |